# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1689/2 - 2011 ජනවාරි 17 වැනි සඳුදා - 2011.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2002 අංක 11 දරන මුදල් පනත**

2 වැනි වගන්තිය යටතේ නියෝගය

2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද 2002 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නිවේදනය මගින් සංයෝජිත වර්ගීකරණ කාණ්ඩ අංක 0102.10 සහ 0104.20.10 යටතේ අභිජනන කටයුතු සඳහා ආනයනය කරනු ලබන කිරි නිෂ්පාදනය කරන සතුන් සහ සංයෝජිත වර්ගීකරණ කාණ්ඩ අංක 8434.10, 8434.20 සහ 8434.90 යටතේ ආනයනය කරනු ලබන කිරි දොවන යන්ත්‍ර, කිරිපට්ටි යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් 2011 ජනවාරි මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ගෙවීමෙන් නිදහස් කරනු ලබන බව ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

02– 419/1

---

## නිවැරදි කිරීමයි

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝග

2010 නොවැම්බර් මස 19 වැනි දින අංක 1680/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය හි 2 (iii) වගන්තියේ පළමු පේළියේ "කර්මාන්ත සංවර්ධන" යන්න වෙනුවට "කර්මාන්ත හා වාණිජ කටයුතු" යනුවෙන් නිවැරදි විය යුතු ය.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2011 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

02 - 419/2

1A - G 14087 — 1,930 (2011/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.